

# බයිසිකලය

කතෘ : නිසිනි දුලන්‍යා වීරසේකර

# බයිසිකලය

නිසිනි දුලන්‍යා වීරසේකර

කතෘ

කතෘගේ වෙනත් කෘති

මලිතිගේ සිහිනය

මහමායා බාලිකා විද්‍යාලය

3 ශ්‍රේණිය B

2026/05/10

# පිදුම

“අ” යනු
“ආ” යනු
කියාදුන්,
මගේ ආදරණීය
ගුරු උතුමන්ලාට
ගෞරවයෙන්,
පුදමි....



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10



එකමත් එක ගමක ශෙහානි කියලා ළමයෙක් හිටියා. ඒ ළමයා බයිසිකල් පදින්න හරිම ආසයි.



ශෙහානි එයාගේ අම්මාගෙන් නිතරම බයිසිකල් ඉල්ලා කරදර කලා. ඒත් ශෙහානිගේ අම්මාට එයාට බයිසිකලයක් අරන් දෙන්න තරම් සල්ලි තිබුණේ නෑ.

ශෙහානි හැමදාම හවසට සෙල්ලම් කරන්න

පිට්ටනියට ගියාම යාළුවන්ගේ බයිසිකල්

ඉල්ලාගෙන හරිම ආසාවෙන් පදිනවා. ඒත්

ශෙහානිට බයිසිකලයක් තිබුණේ නැහැ. එයා ඒ

ගැන හරියට දුක් උනා. ශෙහානි රෑ හීනෙනුත්

දැක්කේ එයාගේම බයිසිකලයක් පදිනවා.


Z Z Z Z




දවසක් ශෙහානිට ඉස්කෝලේ යනකොට එයා

දැක්කා හන්දියේ කඩේ ළඟ ලොකු බැනර් එකක්

එල්ලලා තියෙනවා...

ඒ බැනර් එකේ තිබුණේ බයිසිකල් ධාවන

තරඟයක් ගැන. තරඟයෙන් ජයග්‍රහණය කරන

කෙනාට අලුත්ම බයිසිකලයක් තෑගි විදිහට

හම්බෙන බව දැන්වීමේ කියලා තිබුණා. ශෙහානිට

හරිම ආසා හිතුණා මේ තරගයට ඉදිරිපත් වෙන්න.

මොකද බයිසිකලය දිනාගන්න පුළුවන් කියලා

ශෙහානි හොඳටම විශ්වාස කලා.

"ඒත් බයිසිකලයක් කොහෙන්ද තරඟයට යන්න?"

ශෙහානි කල්පනා කළා. පිට්ටනියේ සෙල්ලම්

කරන්න එන යාළුවෙක්ගෙන් බයිසිකලයක් ඉල්ලා

ගන්න ශෙහානි හිතුවා.

ශෙහානිගේ හොඳම යාලුවා වුනේ නෙතුකි. නෙතුකිට උපන්දිනයට එයාගේ අම්මා බයිසිකලයක් අරන් දුන් බව ශිහානි දැනගෙන හිටියා. නමුත් නෙතුකිට තාම හරියට බයිසිකලය පදින්න බෑ.

ශෙහානි නෙතුකිලාගේ ගෙදර ගිහින් බයිසිකල් ධාවන තරගය ගැන විස්තර කිව්වා. "ඉතින් ඔයා ඉදිරිපත් වෙන්න ඒ තරඟයට ඔයාට අනිවාර්යයෙන්ම දිනන්න පුළුවන්" නෙතුකි කිව්වා. "මට බයිසිකලයක් නෑනේ" ශෙහානි කිව්වා.

"ඉතිං ඔයා මගේ බයිසිකලේ පදින්න" නෙතුකි කිව්වා. ශෙහානිට හරිම සතුටුයි. ඔය ඇත්තටමද නෙතුකි? ශෙහානි ඇසුවා. ඔව් ශෙහානි ඔයා මගේ හොඳම යාළුවා, ඔයාට හොඳට බයිසිකල් පදින්න පුළුවන්. ඉතිං ඔයා මගේ බයිසිකලේ පැදලා මේ තරඟය ජයග්‍රහණය කරනවා දකින්න මං ආසයි.

ඉතිං ශෙහානි එදා ඉදන් හැමදාම හවසට තරඟය සඳහා පුහුණුවීම් කළා. හෙමින් හෙමින් තරඟය තියෙන දවස උදා වුණා.

ශෙහානි උදෙන්ම අවදි වී තරඟයට මුහුණ දීමට යාමට සූදානම් වුණා. අම්මාට වැඳලා ආශිර්වාද අරන් ශෙහානි ගෙදරින් පිටත් වුණා. හොඳ සූදානමකින් ශෙහානි තරඟය පටන් ගන්නා ස්ථානයට ගියා.

තරඟය ආරම්භ කරන්න සියල්ල සූදානම් වුණා. එක... දෙක... තුන... වෙඩි හඬත් සමගම තරඟය ආරම්භ වුණා. සෑම තරගකරුවෙක්ම වේගයෙන් ඉදිරියට ඇදුනා. ශෙහානිට තමන් මෙතෙක් පුහුණුවීම් සිදුකොට ලබාගත් අත්දැකීම් සමගින් පහසුවෙන්ම ජයග්‍රහණය කරා ළඟා වීමට හැකි වුණා.



තෑගි බෙදා දීමේ උත්සවය ආරම්භ වුණා. තරඟයේ ප්‍රථම ස්ථානය දිනා ගැනීම වෙනුවෙන් ශෙහානෙට අළුත්ම බයිසිකලයක් තෑගි විදිහට ලැබුණා. කියාගන්න බැරි තරම් සතුටුයි. ශෙහානිගේ අම්මටත් එදා හරිම සතුටුයි. දුවගේ ආසාව ඉෂ්ට වුනු නිසා. ශෙහානිගේ යාළුවා වුණු නෙතුකිටත් හරිම සතුටුයි. ශෙහානි නෙතුකිට ගොඩක් ස්තූතිවන්ත වුණා. උත්සාහය, දැඩි කැපවීම නිසා ශෙහානි තමන්ගේ සිහිනය සැබෑ කරගත්තා.


1
2
3

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දූරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

**978-624-211-258-9**